ලැගුම්දෙණියේ පියරතන හිමි
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

*Paper: Equity*

# පොළොන්නාරුව දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාල ග්‍රන්ථ වර්ගීකරණය පිළිබඳ අධ්‍යයනයක්

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ පොළොන්නාරුව දිස්ත්‍රිකයේ මහජන පුස්තකාල භාවිත කරන වර්ගීකරණක්‍රම, එම වර්ගීකරණක්‍රම භාවිතයේ මට්ටම් හා වර්ග අංක සකස් කිරීමේදී භාවිතා කරන විශේෂ ක්‍රම අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනයේ නියදිය ලෙස පොළොන්නාරුව දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාල 21 ක් යොදා ගන්නා ලදී.

මෙම අධ්‍යයනයෙදී පෙනී ගියේ පොළොන්නාරුව දිස්ත්‍රිකයේ මහජන පුස්තකාල ග්‍රන්ථ වර්ගීකරණ කාර්ය පොදුවේ සිදුකරන නමුත් ඒවා ග්‍රන්ථ වර්ගීකරණ කාර්යයන් නිසි අයුරෙන් සිදුනොකරන බවත් ඩිවි දශම වර්ගීකරණ ක්‍රමය මහජන පුස්තකාලවල භාවිතා නොකරන බවත්ය. ඇතැම් පුස්තකාල වර්ගීකරණ ක්‍රමය භාවිතා කරන නමුත් බොහෝ පුස්තකාල වල ඩිවි දශම වර්ගීකරණ ක්‍රමය පිළිබඳ නිසි අවබෝධයක් නොමැති බව දැකිය හැකිය.

මහජන පුස්තකාල මුහුණපාන ගැටලු මොනවාද, මහජන පුස්තකාල ව්‍යුහය කෙසේ සකස්වී ඇද්ද, පුස්තකාල ග්‍රන්ථ වර්ගීකරණය පිළිබඳ පුස්තකාලයාධිපති සහ එහි කාර්ය මණ්ඩලයේ දැනුම කෙබඳුදැයි හඳුනා ගැනීමටද මෙම අධ්‍යයනයේ දී හැකි විය.

ග්‍රන්ථ වර්ගීකරණයේ දි පොළොන්නාරුව දිස්ත්‍රිකයේ මහජන පුස්තකාල මුහුණපාන ප්‍රධාන ගැටලු වන්නේ පුහුණු කාර්ය මණ්ඩලයක් නොමැතිකම, පුස්තකාල ග්‍රන්ථ වර්ගීකරණය පිළිබඳ අවබෝධය අඩු බව, ඉංග්‍රිසි භාෂාව පිළිබඳ අවබෝධය අඩු බව හා ඩිවි දශම වර්ගීකරණ පොත් මිල අධික වීම හේතුකොටගෙන එම පොත් ලබාගැනීමට පවතින දුෂ්කරතාව යන කරුණුය. මේ හේතුකොටගෙන මෙම පුස්තකාල වල ග්‍රන්ථ වර්ගීකරණ ක්‍රියාවලිය මන්දගාමීව සිදුවන බව දක්නට ලැබුණි.

පොළොන්නාරුව දිස්ත්‍රිකයේ මහජන පුස්තකාල වලට ඩිවි දශම වර්ගීකරන ග්‍රන්ථ මිලදී ගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීම, එසේම පුස්තකාල කාර්ය මණ්ඩලයට පුහුණු සැසි පැවැත් වීම, පුස්තකාල සහයෝගිතාව වර්ධනයට කටයුතු කිරීම සහ මූල්‍යමය පහසුකම් සැලසීම මගින් ඉහත සඳහන් දුර්වලතා මගහරවා ගත හැකිය.